ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.
☎ 011 279 7400
011 286 4051

මගේ අංකය / எனது இல / My No.

ඔබේ අංකය / உமது இல / Your No

දිනය / திகதி / Date 2020.11. 10

**චක්‍රලේඛ අංක :2020/18**

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්

ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්)

**<u>රජයේ ඉඩම් කළමනාකරණය</u>**

රජයේ අවශේෂ කැලෑ කළමනාකරණය මැයෙන් වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක MWFC/1/2020 දරණ 2020-11-04 දිනැති චක්‍රලේඛය වෙත ඔබගේ අවධානය යොමු කරවමි.එම චක්‍රලේඛයේ 3 වන ඡේදයේ සඳහන් පරිදි ආපසු භාර ගැනීමට නියමිත රජයේ ඉඩම් විධිමත්ව කළමනාකරණය සඳහා පහත පරිදි කටයුතු කරන ලෙස මෙයින් උපදෙස් දෙමි.

2 **<u>ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් හඳුනා ගැනීම හා ආපසු භාර ගැනීම</u>**

රජයේ අවශේෂ කැලෑ කළමනාකරණය සම්බන්ධයෙන් නිකුත් කර තිබූ අංක 5/2001, 2/2006 සහ 5/98 චක්‍රලේඛ අවලංගු වීම හේතුකොට ගෙන ඔබගේ භාරයට ගැනීමට නියමිත රජයේ ඉඩම්, දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවේ එකඟතාවය ඇතිව ඉඩම් සංවර්ධන ආඥා පනතේ 8 වන වගන්තියේ සඳහන් කාර්යයන් සඳහා වෙන් කිරීමට කටයුතු කළ යුතුය. එසේ භාර ගැනීමට නියමිත රජයේ ඉඩම් අවසාන ගම් සිතියම් තුළට ඇතුළත් නොවේ නම් හෝ අවසාන ගම් සිතියමක් හෝ වෙනත් පිඹුරක් නොමැති හා මැනුම්කර නොමැති (Unsurveyed area) ප්‍රදේශයකට අයත් වන අවස්ථාවලදී එම ඉඩම සර්වේයර් ජනරාල් මඟින් මැනුම්කර භුක්තිය භාර ගැනීමට කටයුතු කළ යුතුය. මෙම කාර්යය කඩිනමින් අවසන් කළ යුතු බැවින් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි සමඟ සම්බන්ධිකරණය වෙමින් GPS තාක්ෂණය වැනි ක්‍රමවේද යොදා ගනිමින් ඉඩම හඳුනා ගැනීමට ක්‍රියාකළ යුතු අතර අවසාන ගම් පිඹුරක් හෝ වෙනත් පිඹුරක් තුළට ඇතුලත් වන අවස්ථාවක හැකිතාක් දුරට ඊට අනුරූපි වන පරිදි මායිම් හඳුනා ගෙන එම ඉඩම්වල භුක්තිය භාර ගැනීමට ක්‍රියාකළ යුතුය.

2.1 මෙම කාර්යය සඳහා ප්‍රාදේශීය මට්ටමේ දී ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ, වන සංරක්ෂක ජනරාල්ගේ, වනජීවි සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝජිතයින් සහ අවශ්‍ය වූ විට වාරිමාර්ග, පුරාවිද්‍යා, ගොවිජන සංවර්ධන, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ආදී ආයතනවල නියෝජිතයන්ද ඇතුළු ඊට අදාල අනෙකුත් නිලධාරීන්ද සහභාගී වන ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටුවේ එකඟතාවය ලබා ගැනීම කළ යුතුය.

2.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ දී තීරණ ගැනීමට යම් යම් බාධා, ගැටළු හා වෙනත් මගපෙන්වීම් අවශ්‍ය වන්නේ යැයි පෙනී යන අවස්ථාවලදී පමණක් දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව මඟින්ද දිස්ත්‍රික් මට්ටමින් විසඳාගත නොහැකි අවස්ථාවලදී පමණක් ඒවා ජාතික මට්ටමින් සලකා බැලීම සඳහා මා වෙත එවීමට ද කටයුතු කළ යුතුය.

## 3. භාරගත් රජයේ ඉඩම් විවිධ සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගැනීම

එසේ භාරගත් ඉඩම්වල දැනටමත් ස්ථිර පදිංචිය හා/හෝ ස්ථිර වගා කටයුතු කර සංවර්ධනය කර ඇති තැනැත්තන් සම්බන්ධව මාගේ 2008/4, 2008/4 (1) හා 2018/1 දරණ චක්‍රලේඛ හා එහි දක්වා ඇති ක්‍රමවේදය අනුව කටයුතු කළ යුතුය. අනෙකුත් ඵලදායි ආර්ථික කටයුතු සඳහා හඳුනාගත් හිස් ඉඩම් සම්බන්ධයෙන් මාගේ 2020/17 හා 2020/17 (1) දරණ චක්‍රලේඛ හා එහි දක්වා ඇති ක්‍රමවේදය අනුව කටයුතු කළ යුතුය. මෙම චක්‍රලේඛ මගින් ආවරණය නොවන කරුණක් සම්බන්ධයෙන් රජයේ ඉඩම් සඳහා නිකුත් කර ඇති අණපනත් හා චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

## 4. භාරගත් රජයේ ඉඩම් ආරක්ෂා කිරීම

රජයේ ඉඩම් වලට අනවසරයෙන් ප්‍රවේශවීමට අවස්ථාව කිසිදු තැනැත්තෙකුට හෝ සංවිධානයකට ලබා නොදිය යුතු බව අවධාරණය කරමි. එවැනි අනවසර ප්‍රවේශයක් දරණ කවර හෝ තැනැත්තෙකුට හෝ සංවිධානයකට රජයේ ඉඩම් ආරක්ෂා කිරීම සඳහා පවතින නීති රෙගුලාසි නියෝග හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර එම ඉඩම් ආරක්ෂා කිරීම ඔබ සතු වගකීමක් වේ. එබැවින් ඔබගේ ග්‍රාම නිලධාරීන් හා ක්ෂේත්‍ර නිලධාරීන් මගින් රජයේ ඉඩම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය ක්‍රමවත් කර පවත්වා ගැනීමට කටයුතු කළ යුතු අතර මේ පිළිබඳ නිරන්තර පසුවිපරම් කළ යුතු බව ද, අවධාරණය කරමි.

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වුවහොත් මා විමසීමට කටයුතු කරන මෙන් ද මෙයින් දන්වමි.

කරුණාකර මෙම චක්‍රලේඛය ලද බව දන්වන්න.

ජී.ඩී. කීර්ති ගමගේ

ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය
2. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය
3. ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය
4. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය
5. ලේකම්, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය
6. ලේකම්, පරිසර අමාත්‍යාංශය
7. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
8. සෙසු සියලුම අමාත්‍යාංශ ලේකම්වරු
9. පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරු
10. සියලුම දිස්ත්‍රික් ලේකම්වරු
11. ලේකම්, ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර, ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
12. ලේකම්, අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
13. සෙසු සියලුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරු
14. පළාත් සභාවල ඉඩම් අමාත්‍යාංශ ලේකම්වරු
15. පළාත් ආණ්ඩුකාර ලේකම්වරු
16. සර්වේයර් ජනරාල්, සර්වේයර් ජනරාල් දෙපාර්තමේන්තුව
17. හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්,
18. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
19. අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
20. වන සංරක්ෂණ ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
21. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
22. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
23. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
24. අධ්‍යක්ෂ ජනරාල්, මැණික් හා ස්වර්ණාභාරණ අධිකාරිය
25. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
26. සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
27. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය

- දැ.ග.ස හා අ.ක.ස.